# කුවේණි-විභීෂණ ද කුසුමාසන-විමලධර්මසූරිය ද

එදා බමුණන් කුවේණිය යොදාගෙන රාජ්‍ය අත්පත් කරගෙන පසුව කුවේණිය පළවා හැරියහ. පෘතුගීසි සමයෙහිදී, පෘතුගීසි බමුණෝ එලෙස නොවුවත් දෝන කතිරිනා හෙවත් කුසුමාසන දේවිය යොදාගෙන කන්ද උඩරට රාජ්‍ය ලබාගෙන පසුව ඇය පළවා හැරීමට සැලසුම් කළහ. (පළවා හැරීමට කළ සැලැස්ම ගැන මා දන්නේ කෙසේ දැයි යම් බමුණකුට හේ බැමිණියකට හෝ ප්‍රශ්නයක් නම් ඔහුට හෝ ඇයට හෝ කැලණිය විශ්වවිද්‍යාලයේදී මා හමුවිය හැකිය. බමුණාට හෝ බැමිණියට හෝ ඒ සඳහා ගමන් ගාස්තු හා වෙනත් දීමනා රාජ්‍ය නොවන සංවිධානයකින් ලබාගත හැකිය.) එහෙත් කොනප්පු බණ්ඩාරයෝ ඒ සැලසුම ව්‍යර්ථ කළහ. (ඒ ගැන විස්තරයක් සුගතදාස අබේවික්‍රම මහතා විසින් රචිත නොදැවුණු හදවත කෘතියෙහි වෙයි) අද ඇමරිකන්, බ්‍රිතානි, නෝර්වේ ආදී විවිධ බමුණෝ නොයෙකුත් සැලසුම් කරති. අපට මේ සැලසුම් පරාජය කළ හැකිය.

කොටින්ට ඊනියා සාම සාකච්ඡා තාවකාලිකව වර්ජනය කිරීමෙන් දැනටමත් විශාල ජයග්‍රහණයක් ලැබී ඇත. ඊනියා ආණ්ඩුව යාපනයේ අධි ආරක්ෂිත කලාපයේ තිබූ හමුදා කඳවුරු ඉවත් කර ගෙන ඇත. මේ සම්බන්ධ පෘථග්ජන ජනයාට වැරදි අවබෝධයක් දීමට ඊනියා ආණ්ඩුව උත්සාහගෙන ඇත. ආණ්ඩුව යන වචනය ඇතැම් තැන්වල යෙදුණද මෙරට ආණ්ඩුවක් නැත. මෙහි ඇත්තේ ඇමරිකන් තානාපති ඇතුළු ඇතැම් බටහිර තානාපතියන් විසින් මෙහෙයවනු ලබන තරමක් ලොකු රාජ්‍ය නොවන සංවිධානයක් පමණකි. හමුදා කඳවුරු ඇතැම් ප්‍රදේශ වලින් ඉවත්කර ගැනීමෙන් යාපන අර්ධද්වීපයේ ආරක්ෂාවට තර්ජනයක් නොවේ යැයි ආණ්ඩුව කියයි. එය හමුදාවේ අනුමැතිය ඇතිව කෙරුණක් බවද ආණ්ඩුවේ ප්‍රකාශනවල සඳහන් වෙයි. හමුදාවේ ඊනියා අනුමැතිය ලබා ගන්නේ ආණ්ඩුව වීම නිසා ඒ ප්‍රකාශයේ කිසිම වලංගු බවක් නැත. අප රටේ හරි හමන් හමුදා නායකයන් සිටියේ නම් ඊනියා ආණ්ඩුවට ඔය කියන ඊනියා අනුමැතිය නොලැබෙනු ඇත. කොටි, නෝර්වේ හා ඇමරිකානු බලපෑම මත හමුදා කඳවුරු ඉවත්කර ගත්තේ ය යන්න බොරු වාහිනියේ හෙවත් විජාතික රූපවාහිනියේ ටයිකෝට් අඳින අවමංගල අධ්‍යක්ෂවරුන් හා බොරු මහාචාර්යවරයාගේ සුරතලියන් කිසි දිනෙක නොකියනු ඇත.

අද යාපනයේ හමුදා කොටුවට පමණක් සීමා වී ඇත. මින් ඉහතද කොටුවට පමණක් සීමා වී සිටි හමුදාවලට අත් වූ ඉරණම අපි දනිමු. සිංහලයන් තරම් අත්දැකීම් වලින් පාඩම් ඉගෙන නොගන්නා වෙනත් ජාතියක් ලොවේ නැතැයි සිතෙන තරම්ය. කොටි යාපනේ කොටුවට ප්‍රහාරයක් එල්ල කළහොත් හමුදා භටයන්ට අත්වන ඉරණම ගැන අමුතුවෙන් කිවයුතු නොවේ. ඊනියා සටන් විරාමය තුළ කොටි නිහඬව සිටින්නේ යැයි කිව හැක්කේ මුග්ධයෙකුට හෝ වංචනිකයකුට හෝ පමණි. මෙරට රාජ්‍ය නොවන සංවිධානවල, විශ්ව විද්‍යාලවල, ඊනියා ප්‍රබුද්ධ ජනමාධ්‍යවේදීන් අතර සහ වෙනත් තැන්වල සිටින බක පණ්ඩිතයෝ අද සාමය ඇතැයි නන් දොඩවති. මොවුන් සාමය යැයි කියන්නේ කොළඹ බෝම්බ නොපිපිරවීමටය. කොළඹ බොම්බ පුපුරන්නේ නැති වුවද අද ද කොටි කොළඹ මිනී මරති. ඊනියා සාමය කැඩෙන්නේ මිනිසුන් දහ පහලොස් දෙනකු එකවිට මියගිය විට පමණද? කොටි තමන්ට විරුද්ධ දෙමළ ජනයා ඝාතනය කරති. තමන්ට කප්පන් නොදෙන අවනත නොවෙන දෙමළ පුද්ගලයන් කිහිප දෙනකු ම ඊනියා සටන් විරාමයෙන් හෙවත් පාවා දීමේ ගිවිසුමෙන් පසුව මරා දැමීමට කොටි සමත් වී ඇත. හමුදාවේ බුද්ධි අංශයේ සේවය කළ දෙමළ භටයෝ පසුගිය මාස දාහතරක පමණ කාලය තුළ මරා දමනු ලැබූහ. මේ ජීවිත වලට වග කිවයුත්තෝ බොහෝ වෙති. මිලේනියම් සිටි සංකීර්ණයේ පවත්වාගෙන ගිය විශේෂ හමුදා ඒකකයේ තොරතුරු සතුරන්ට හෙළි කළේ ඊනියා ආණ්ඩුවමය. දොන් ජුවන් ධර්මපාල රජුවත් මෙලෙස ක්‍රියා කර නැත. මේ විභීෂණ මට්ටමේ පාවා දීමකි.

විභීෂණ කතාව කලින් කියා ඇති මුත් සිංහලයන්ට අමතක වීමේ ගුණය ඕනෑවට වඩා තිබෙන බැවින් එය නැවත කීමේ වරදක් නැත. රාම රාවණ යුද්ධය මෙරට පැවතුණා ද නැද්ද යන්න මෙහිදී ප්‍රශ්නයක් නොවේ. විභීෂණ යන්නෙහි තේරුම භීෂණයට විරුද්ධ යන්න ය. විභීෂණ යන්න ඔහුට ඔහුගේ දෙමව්පියන් දුන් නමක් නොව රාමගේ කේවට්ට බමුණු මහල්ලන් දුන් නමක් විය යුතුය. විභීෂණ යනු රාවණ රජු විසින් කරන ලද යුද්ධයට විරුද්ධව, ඊනියා භීෂණයට විරුද්ධව සාමය කතා කළ තැනැත්තා විය. මේ ද්‍රෝහියා බලයට කෙතරම් කෑදරවී ද යතහොත් ඊනියා භීෂණයට විරුද්ධ වී තම සොයුරාද රටද පාවා දීමට කටයුතු කළේය. රාවණ රජු පාවා දී ඔහු ඊනියා රාජ්‍ය පවත්වාගෙන ගියේ එකල කළාපීය බලවතා වූ රාමගේ දෙපා ලෙව කෑමෙනි. යුද්ධයට විරුද්ධ වීම ඊනියා සාධු ධර්මයක් ලෙස සලකා

© Prof. Nalin De Silva

ද්‍රෝහියාට විභීෂණ නම පට්ටම (අභිනන්ධනය) දී ඔහු උත්තම පුරුෂයෙකු කිරීමට රාමගේ කේවට්ටයනට එතරම් ප්‍රශ්නයක් නොවන්නට ඇත. එකල බොරු වාහිනිය නැති වුවද සංනිවේදන ආධිපත්‍ය දරන්නට ඇත්තේ පොත පත ලියූ කේවට්ටයන් බවට සැකයක් තිබිය නොහැකි ය. වත්මන් සාම කුමරුන් ගැන කල්පනා කිරීමේදී විභීෂණයාගේ හා කේවට්ටයන්ගේ තරම අපට සිතා හැකිය. මුළු ලෝකයටම ආදර්ශයක් දෙන අන්දමේ ඊනියා සාම ක්‍රියා වලියක් මෙරට සිදු වන බව අපට කියන්නේ ඊනියා ජාත්‍යන්තර ප්‍රජාවගේ කේවට්ට බුද්ධිමතුන්ය. මේ බටහිර ඊනියා බුද්ධිමත්තු විශේෂයෙන්ම සමාජයීය විද්‍යා හැදෑරූ කසිකබල් බුද්ධිමත්තු වත්මන් කේවට්ටයෝ වෙති. කිසිම දෙයක් තේරුම් කර දීමට අසමත් බටහිර සමාජයීය විද්‍යාවන්ට තැනක් ඇත්තේ බටහිර ගණිතයට, භෞතික විද්‍යාවට, රසායන විද්‍යාවට, ජීව විද්‍යාවට , හා ඒ ආශ්‍රිතව ඉංජිනේරු හා වෛද්‍ය වැනි තාකෂණයට හා බටහිර දේශපාලන ආධිපත්‍යයට පිං සිදු වන්නටය. මින් අදහස් වන්නේ පසුව කී විද්‍යාවන් ශ්‍රේෂ්ඨ බව හෝ අප ඒ අනුකරණය කළ යුතු බව හෝ නොවේ. ඒ විද්‍යාවන්ගෙන් අපට ගතයුතු දෙයක් වේ නම් අප ඒ අවශෝෂණය කරගත යුතුය. එහෙත් බටහිර සමාජයීය විද්‍යාවන්ගෙන් නම් අවශෝෂණය කළ යුතු යමක් වේද යන්න ඉතාමත් සැක සහිතය.

අද රාජ්‍ය නොවන සංවිධානවල, විශ්ව විද්‍යාලවල, ජනමාධ්‍ය ආයතනවල, සිටින දේශීය කේවට්ටයන් කරන්නේද එදා රාමගේ දේශීය කේවට්ටයන් කළ දේමය. ඊනියා සාමය, යුද්ධයට විරුද්ධ වීම ආදිය ගැන කතා කරන මේ දේශීය කේවට්ටයන්ගේ වර්තමාන රාම යනු බුෂ් කණිෂ්ඨයා හෙවත් ඇමරිකන් ජනාධිපතිය. විශ්ව විද්‍යාලවල සිටින මේ කේවට්ටයෝ ගැටුම නිරාකරණය ගැන මහා පරිමාණයෙන් කතා කළද විශ්ව විද්‍යාල සිසුන් අතර ඇතිවන ගැටුම නිරාකරණය කිරීමට අසමත් වෙති. මෙය ලෝකෙට පරකාසේ ගෙදරට මරගාතේ ප්‍රපංචයද එසේ නැතිනම් ඩොලර් ප්‍රපංචයද යන්න නිශ්චිතව කීමට නොහැකිය. සමහර විට එය ප්‍රපංච දෙකේම එකතුව ( සම්ප්‍රයුක්තය ) විය හැකිය. වත්මන් සරසවි සිසුන් මේ ගැන කල්පනාකාරී විය යුතුය. සරසවි සිසුන් භේද භින්න වී අනවශ්‍ය කලකෝලහල නොකර තම විවිධ (දේශීය හෝ දේශීය කරණය කළ) මතවාද තබා ගනිමින් ම සමගියෙන් කටයුතු කිරීමට සියල්ලට ම පළමුවෙන් ඉගෙන ගත යුතුය.

අපේ සාහිත්‍යයේ විභීෂණ වැනි තවත් චරිතයක් වෙයි. ඒ කුවේණිය. කුවේණි යන්නෙහි තේරුම කු වර්ණයක ඇත්තී යන්නය. මෙහි කුවර්ණය හෙවත් නරක වර්ණය යන්නය යොදන්න ඇත්තේ මෙරට යකෂ ගෝත්‍රිකයන්ගේ පාටට බොහෝ විට දුඹුරු පාට විය යුතුය. කුවේණිගේ පාටට නරක් වන්නට ඇත්තේ ඇගේ දෙමව්පියන්ට නොව ආර්යයන් සමග මෙරටට පැනිණි බමුණන්ට විය යුතුය. කුවේණි යන්න බමුණන් ඇයට දුන් නම මිස ඇයට දෙව්පියන් දුන් නම නොවේ. විභීෂණ උසස් ලෙස සැලකූ බමුණෝ කුවේණිය පහත්කොට සැලකූහ. එයට හේතුව කුවේණිගේ වූ මහගු ගුණයක් නොවේ. එක් පැත්තකින් ඉන් කියැවෙන්නේ බමුණන්ගේ ස්ත්‍රී විරෝධී ආකල්පය.

අනෙක් පැත්තෙන් කුවේණිය පහ කර දැමීමට බමුණන්ට වූ අවශ්‍යතාවය ය.

කුවේණි ගැන කතාවට පළමුව අප රටේ ඉතිහාසය ගැනකිව යුක්තක් වෙයි. මේ රටේ ඉතිහාසයේ ඉතා ඈත අතීතයේ සිට සිදු වී ඇත්තේ එකම එක කරුණක් පමණය. එනම් විදේශික, විජාතික ආක්‍රමණවලට විරුද්ධව ජාතික රජවරුන් හා නායකයන් කටයුතු කිරීමත් ජයග්‍රහණය කළ අවස්ථාවල ඉන් පසු රටේ හා ජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් ඒ ජයග්‍රාහක රජවරුන් ක්‍රියා කිරීමත්ය. විදේශික ආක්‍රමණවල දී විභීෂණලා ඊනියා යුද්ධයට එරෙහිව මතු වීමද අපට දැකගත හැකිය. මෙයට සමාන්තරව මෙරට බුද්ධිමතුන් අතරද එවැනි ක්‍රියා වලියක් සිදු වී ඇත. විජාතික මතවාද රැගෙන මෙරටට පැමිණි බමුණු කේවට්ටයන් අනුකරණය කළෝ මෙරට සැමදාමත් සිටියහ. මොවුහු විජාතික නායකයන් සමග එක් වී මෙරට බමුණු කුළයක් ගොඩ නැගූහ. ඒ බමුණු කුළයට එරෙහිව මෙරට දේශීය බුද්ධිමතුන්ගේ අදීන ක්‍රියා කාරකම් ද අපට දැකගත හැකිය. දේශීය බුද්ධිමත්තු විජාතික මතවාද අවශ්‍යවිට ප්‍රතිකෙෂ්ප කිරීමටද අනෙක් අවස්ථාවල අවශෝෂණය කිරීමටද දැන සිටියහ. බමුණු මතවාද අනුකාරකයන් කේවට්ට පරම්පරාව ලෙසද දේශීය බුද්ධිමතුන් මහෞෂධ පරපුර ලෙසද හැඳින්වීම උචිත යැයි සිතමි. මේ දෙපිරිස අතර ගැටුම උමංදාව රචිත අවධියේ පමණක් නොව ඊට පෙර හා පසුද පැවතුණි. අද ඉන්නා කේවට්ටයෝ ලිබරල්වාදය, මාක්ස්වාදය, පශ්චාත් නූතනවාදය ආදී බටහිර බමුණු මතවාද අදහති. (කලින් කියා ඇති අන්දමට මේ කසිකබල් මතවාදවලට තැනක් ඇත්තේ බටහිර විද්‍යාවන්ට, තාකෂණයට හා බටහිර දේශපාලන ආධිපත්‍යයට පින් සිදුවන්නට මිස ඒ මතවාදවල ඇති ගැඹුරු බවක් නිසා නොවේ) භාරතයෙන් පැමිණියද, යුරෝපයෙන් හෝ ඇමරිකාවෙන් හෝ පැමිණිය ද බමුණා

© Prof. Nalin De Silva

බමුණාම වෙයි. බැමිණිය බැමිණියම වෙයි. එහිදී ස්ත්‍රීවාදය ද අරකද මේකද යන්න වැදගත් නොවේ. බටහිර ස්ත්‍රීවාදය ද අද දවසේ නම් බමුණු (බැමිණි) මතවාදයක්ම වෙයි. (අවශ්‍ය නම් පසුදිනෙක එය පැහැදිළි කරමි. කෙසේ වෙතත් මේ බැමිණියන්ගේ සාමාන්‍ය ගැහැණුන්ගේ නොව දිට්ඨ මංගලිකාලාගේ කරපිටින් යන මාතංගලා අද මෙරටට අවශ්‍ය වෙයි.) මේ සමහර කේවට්ටයෝ අධිරාජ්‍ය විරෝධීන් ලෙස පෙනී සිටියද, අංක එකේ සංස්කෘතික යටත්විජිතවාදීහු වෙති. බුෂ්ගේ කේවට්ටයන් වූ මොවුන්ට මාක්ස්, වෙබර්, ඩෙරීඩා ආදී බටහිර බමුණන්ට කැහීම හැර කළහැකි අධිරාජ්‍ය විරෝධී සටනක් නැත.

නැවතත් අපි කුවේණිය ගැන කතා කරමු. හිටපු පුරා විද්‍යා කොමසාරිස් ආචාර්ය ශිරාන් දැරනියගල මහතාට අනුව ආර්යයන් මෙරටට පැමිණීම ආරම්භ කර ඇත්තේ දැනට වසර තුන්දාහකට පමණ පෙරය. ඒ මහාවංශයේ සඳහන් විජය සම්ප්‍රාප්තියට අවුරුදු හාරසීයකට පමණ පෙරය. විජය යන්න ද බමුණන් ඔහුට දුන් නමක් යැයි සිතමි. මෙරට ආර්යයන්ට යම් තීරණාත්මක ජයග්‍රහණයක් ලබාදුන් තැනැත්තාට බමුණන් විජය යැයි කියන්නට ඇත. මේ සිද්ධිය, එනම් විජය යක්ෂ නායකයන් විශාල පිරිසක් මරා දමා ජයගැනීම උවද මහාවංශයේ සඳහන් දිනයට පෙර සිදුවී යැයි සිතිය හැකිය. කෙසේ වෙතත් එහිදී තම නෑදෑයන් මරා දමා විජයට ජයගැනීමට ආධාර කළේ කුවේණී නම් යක්ෂ කුමරියය. ඇය රාජ්‍ය ලෝභයෙන් එසේ කළා යැයි සිතිය නොහැක්කේ ඇය ප්‍රාදේශීය නායිකාවක වූ නිසාය. විජයගේ හැඩිදැඩි සිරුරට වූ ලෝභය ඈ එවැනි තත්ත්වයට පත්කරන්නට ඇත. පසු කාලයකදී ආර්යයන් හා යක්ෂ ආදී හෙළයන් මිශ්‍ර වී පණ්ඩුකාභය සමයේදී සිංහල ජාතිය ගොඩනැගුණු බව ඇත්ත. නමුත් කුවේණි විජයට පෙම් කරද්දී ඔහු විජාතිකයෙක් විය. විජාතිකයකුගේ සිරුරට ලොල්වී තම ගෝත්‍රය පාවාදුන් කුවේණියගේ නමින් වර්තමානයේද විජාතිකයන්ගේ සිරුරට කෙසේ වෙතත් විජාතික දැනුම සිරුරට ලොල්වී ජාතිය පාවාදීමට කටයුතු කරන පරපුරක් බිහිවී සිටීම සහ ඔවුන් තමන්ට අන්වර්ථ නාමයක් යොදාගැනීමද අප සටහන් කරගත යුතුය. තමන්ට රාජ්‍යයක් (ප්‍රාදේශීය විය යුතුය) අත්කරදුන් කුවේණියට බමුණෝ විභීෂණට මෙන් නොසැලැකූහ. (වත්මන් කුවේණි පරපුරට බටහිර බමුණන් සලකන්නේද එපරිද්දමය. බමුණෝ ඉඳහිට ඔවුන්ට විවිධ තෑගි දෙති) බමුණෝ කුවේණි පළවා හැර විජයට පාණ්ඩ්‍ය දේශයෙන් ආර්ය කුමාරිකාවක් (එකල පාණ්ඩ්‍ය දේශය ආර්ය රාජ්‍යයක් බව දෙමළ ජාතිවාදී බමුණු දුහුනන් දැනුම් වස් පැවසිය යුතුය) ගෙන්වා දුන්හ. කුවේණියගේ නෑදෑයෝද කුවේණියට යුතුකම් ඉටු කරමින් ඇය මරා දැමූහ. ඒ පිළිබඳ යම් වත්මන් බැමිණියකට මානව හිතවාදී ප්‍රශ්නයක් මතුවේ නම් ඇයට සදාම් හුසෙන් ඉන්නා තැනකට ගොස් ඔහු හමුවී ඒ නිරාකරණය කරගත හැකිය.

එදා බමුණන් කුවේණිය යොදාගෙන රාජ්‍ය අත්පත් කරගෙන පසුව කුවේණිය පළවා හැරියහ. පෘතුගීසි සමයෙහිදී. පෘතුගීසි බමුණෝ එලෙස නොවුවත් දෝන කතිරිනා හෙවත් කුසුමාසන දේවිය යොදාගෙන කන්ද උඩරට රාජ්‍ය ලබාගෙන පසුව ඇය පළවා හැරීමට සැලසුම් කළහ. (පළවා හැරීමට කළ සැලැස්ම ගැන මා දන්නේ කෙසේ දැයි යම් බමුණකුට හේ බැමිණියකට හෝ ප්‍රශ්නයක් නම් ඔහුට හෝ ඇයට හෝ කැලණිය විශ්වවිද්‍යාලයේදී මා හමුවිය හැකිය. බමුණාට හෝ බැමිණියට හෝ ඒ සඳහා ගමන් ගාස්තු හා වෙනත් දීමනා රාජ්‍ය නොවන සංවිධානයකින් ලබාගත හැකිය.) එහෙත් කොනප්පු බණ්ඩාරයෝ ඒ සැලසුම ව්‍යර්ථ කළහ. (ඒ ගැන විස්තරයක් සුගතදාස අබේවික්‍රම මහතා විසින් රචිත නොදැවුණු හදවත කෘතියෙහි වෙයි) අද ඇමරිකන්, බ්‍රිතානි, නෝර්වේ ආදී විවිධ බමුණෝ නොයෙකුත් සැලසුම් කරති. අපට මේ සැලසුම් පරාජය කළ හැකිය.

දෙමළ ජාතිවාදය යනු ලන්දේසීන් හා ප්‍රධාන වශයෙන්ම බ්‍රිතානීන් මෙරට ඇති කරන ලද්දකි. ඉංගිරිසි කතා කළ නිවට සිංහලයන්ගේ නායකත්වයටද ඉංගිරිසි කතා කරන දෙමළ නායකයන් පත් කිරීම බ්‍රිතානීන්ගේ අභිප්‍රාය විය. සිංහල ජනතාව 75% ක් ව සිටියදී එය කරගත නොහැකි බැවින් අද බටහිරයෝ දෙමළ ජාතිවාදීන්ට උතුරු හා නැගෙනහිර පළාත් දීමට සූදානම් වෙති. කොටි ඊනියා සටන් විරාමය තුළ නොකරන එකම දෙය කොළඹ බෝම්බ පිපිරවීම පමණය. එමගින් බොරු සාමයක් ගැන අදහසක් කේවට්ටයෝ පතුරවති. එහෙත් කොටි කොළඹ දෙමළ හටයන් මරණ අතර නැගෙනහිර මුස්ලිම් ජනයා මරති. ඒ එම පළාත තම ආධිපත්‍ය යටතට ගැනීමටය. ඒ අතර ඊනියා සටන් විරාම නිරීක්ෂණ කමිටුවේද අනුග්‍රහයෙන් හමුදාවට විවිධ පහරදීම් කරති. දෙමළ ජනයාට දෙමළ වීම නිසාම සිදුවී ඇති අසාධාරණයක් නැති විටෙකද කුමාරතුංග මහත්මිය තම බොරු මාක්ස්වාදය කරපින්නා ගෙන ඊනියා අසාධාරණකම් ගැන කියයි. දෙමළ ජාතිවාදය පරාජය කිරීමට ජනාධිපතිනිය තමන් සතු බලතල යොදා

© Prof. Nalin De Silva

නොගනියි. මේ බොරු මාක්ස්වාදය හා බටහිර නායකයන්ට ඇති බිය නිසාය. බමුණු මතවාදවලට මෙන්ම බමුණන්ට ද බිය වී කළ හැක්කේ ජාතිය පාවාදීම පමණකි.

අද ජ.වි.පෙ හා ශ්‍රී.ල.නි.ප. අතර ඇතිවිය හැකි සංධානයක් හරහා ජාතියට නව ශක්තියක් ලැබීමේ ඉඩකඩ වෙයි. එය වළක්වා එ.ජා.ප. හා ශ්‍රී.ල.නි.ප. අතර සංධානයක් ඇතිකිරීමට බටහිර බමුණෝ හා ඔවුනගේ හෙංචයියන් වූ මෙරට ඇතැම් ජනමාධ්‍ය කෝචචිට බමුණු පැටව් කටයුතු කරති. මේ රටේ ඇත්තේ එකම එක ඉතිහාස කතාවක් පමණකි. වරින් වර විවිධ නළුවෝ නිළියෝ එති යති. කතාවේ යම් විවිධත්වයක් ඇත්නම් එයට හේතුව නළු නිළියන්ගේ විවිධත්වයය. එ.ජා.ප. හා ශ්‍රී.ල.නි.ප. අතර සංධානයක් ඇති කොට තවත් කුවේණි හෝ දෝන කතිරිනා සැලැස්මක් මගින් කුමාරතුංග මහත්මියගෙන් ගත හැකි සේවය ලබා ඇය මිරිකා හරින ලද දෙහි ලෙල්ලක් මෙන් විසිකරදැමීම බටහිර බමුණන්ගේ අභිප්‍රාය වෙයි. අප ජීවත්වන්නේ කුවේණි - විභීෂණ යුගයක ද නැත්නම් කුසුමාසන - විමලධර්මසූරිය යුගයකද යන්න තීරණය කළ යුත්තේ අපමය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva